# නූතන සිංහල අක්ෂර මාලාව (පාඩම 8)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| අං | අඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඥ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

## *ස්වර අකුරු හඳුනා ගනිමු*

තනිව උච්චාරණය කළ හැකි අකුරු ස්වර වේ.

මේවා පණකුරු, ප්‍රාණාක්ෂර යනුවෙන්ද හඳුන්වනු ලබයි.
පණකුරු දහ**18**කි.

### *ක්‍රියාකාරකම 1*

පහත දැක්වෙන වගුවෙහි අඩු ස්වර අකුරු සම්පූර්ණ කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | | | ඈ | | |
| | ඌ | | | ඏ | |
| | | ඓ | | ඕ | |

## <u>ස්වර අකුරු ප්‍රධාන කොටස් තුනකි,</u>

- ***<u>කෙටි ස්වර</u>***

කෙටි ස්වර 8කි.

මේවා කෙටි ස්වර , ලඝු ස්වර, ලුහු ස්වර, හස්ව ස්වර

ලෙස ද හඳුන්වයි. ඒවා උච්චාරණයට ගත වන කාලය අඩුය.

### *ක්‍රියාකාරකම 2*

**කෙටි ස්වර භාවිතා කර වගුව සම්පූර්ණ කරන්න.**

| | | | |
|---|---|---|---|
| අ | | | උ |
| | ඏ | | ඔ |

- ***<u>දීර්ඝ ස්වර</u>***

මේවා දික් ස්වර, ගුරු ස්වර ලෙසත් හඳුන්වනු ලබයි.
මේවා උච්චාරණයට ගතවන කාලය කෙටි ස්වර වලට

සාපේක්ෂව වැඩිය.

### *ක්‍රියාකාරකම 3*

**දීර්ඝ ස්වර භාවිතා කර වගුව**

**සම්පූර්ණ කරන්න .**

| | | | |
|---|---|---|---|
| | ඇ | | ඌ |
| | ඐ | ඒ | |

- ***<u>මිශ්‍ර ස්වර</u>***

මේවා සංයුක්ත ස්වර ලෙස ද හඳුන්වනු ලබයි.

සෑදෙන්නේ ස්වර දෙකක් එක්වීමෙනි.

අ + එ - ඓ

අ + ඔ - ඖ

*ඇගයීම*

අක්ෂර මාලාව මතකයෙන් ලියන්න. නිර්මාණාත්මකව සකසා අප වෙත එවන්න.

## බැද්දේගම (පාඩම 9)

**බැද්දේගම නව කතාවෙහි භාෂාත්මක ලක්ෂණ**

1. පුංචිමැණිකා දවසෙන් වැඩි කාලයක් ගත කළේ මේ බියකරු සිතිවිලිවල පැටලී ගෙයි පිලේ හිඳ නිකටට අත තබාගත් ගමන් ය.
2. නෑ, නෑ, නෑ, තුන් මාසෙකට කලින් වෙන්ඩ ඕනෑ.
3. උඹ ළඟ සල්ලි හෙම තියෙනවා ද ගැනියෙ?'
4. උඹ මේ ගමේ ඉන්න කවුරු හරි කසාද බැඳගනින්.
5. උඹ පලයන් ළමයා ආපහු ගමට.'
6. මෝඩයා
7. චේතනා ශක්තියත්, කල්පනා ශක්තියත්, වේදනා ශක්තියත්
8. නෑ, නෑ, නෑ,
9. කසාද බැඳගනින්.
10. මහලු මිනිහෙක්
11. ආරච්චිගේ ගෙය කැලෑබත් වීම
12. වියළි තණ
13. කෙට්ටු එළදෙනුන්
14. වේළිච්ච කුඹුරට
15. වේලක් ඇර වේලක්
16. ගෙයි පිලේ හිඳ නිකටට අත තබා
17. පුංචි මැණිකාට මහල්ලා මුණගැසීම
18. පුංචි මැණිකාට හිරපල්ලා මුණගැසීම
19. අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි.
20. ඇටුවන් බැහී ගිය ගහක් මෙන්
21. සම ගසක පොත්තක් මෙන්

**භාෂාත්මක ලක්ෂණ**

භාවාත්මක බස් වහර ………………………………..

සංවාදශීලී බස් වහර ………………………………..

උපමා මිශ්‍ර බස් වහර ………………………………..

සංකේතාත්මක බස් වහර ……………………………

අනුප්‍රාසාත්මක යෙදුම් ………………………………

ජන වහර …………………………………………

අවස්ථා හා සිද්ධි ……………………………………

## ව්‍යඤ්ජන අක්ෂර වර්ගීකරණය කිරීම (පාඩම 10 )

ව්‍යඤ්ජන අක්ෂර ඇරඹෙන්නේ,

(අ)ං - අනුස්වාරය

(අ)ඃ - විසර්ගය

අකුරු වලිනි.

01 - ක්‍රියාකාරකම

I. අනුස්වාරය යෙදෙන වචන 03 ක් ලියන්න.
   උදා. සංකල්පය
   1.............................. 2................................ 3..................................

II. විසර්ගය හෙවත් විසර්ජනිය යොදා හිස්තැන් සම්පූර්ණ කර, විසර්ගය යෙදෙන වචන හඳුනා ගන්න.
   1.මන....කල්පිත 4.අන්ත...ඛණ්ඩය
   2.දු...ඛදායක 5.අන්ත....ස්ථාක්ෂර
   3.අන්ත...පුරය

02. ක්‍රියාකාරකම

❖ අර්ධානුනාසිකා අක්ෂර හෙවත් සඤ්ඤක අක්ෂර යෙදෙන වචන 03 ක් සොයා ලියන්න.
   (“ඦ” අක්ෂරය හැර)
   ඟ - සඟ .........................., ............................, ...........................
   ඬ - හඬ .........................., ............................, ...........................
   ඳ - ගඳ .........................., ............................, ...........................
   ඹ - අඹ .........................., ............................, ...........................

03 - ක්‍රියාකාරකම

- පහත දක්වා ඇති මහාප්‍රාණ අක්ෂර හඳුනාගෙන, එම අක්ෂර යෙදෙන වචන 02 බැගින් සොයා ලියන්න.
  ඛ - .................., ...................... ඝ - ...................., ..........................
  ඡ - .................., ...................... ඣ - .................., ..........................
  ඪ - .................., ...................... ඨ - ...................., ..........................
  ථ - .................., ...................... ධ - ...................., ..........................
  ඵ - .................., ..................... භ - ...................., ..........................
- ඝෝෂ, අඝෝෂ අක්ෂර හඳුනා ගනිමු.
  පහත දක්වා ඇත්තේ ඝෝෂ අක්ෂරයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| අඃ | | | | | |
| | | ග | ඝ | ඞ | ඟ |
| | | ජ | ඣ | ඤ | ජ |
| | | ඩ | ඪ | ණ | ඬ |
| | | ද | ධ | න | ඳ |
| | | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| | | | හ | ළ | |

04 - ක්‍රියාකාරකම

i. අක්ෂර මාලා සටහනේ දක්වා ඇත්තේ ඝෝෂ අක්ෂරයි. එම අක්ෂර හඳුනාගෙන මතක තබා ගන්න.

ii. සටහනේ රතු පැහැයෙන් දක්වන ලද කොටුවට අදාළ අකුරු සම්පූර්ණ කරන්න.ඒවා අඝෝෂ අකුරු වේ.හඳුනාගන්න. මතක තබාගන්න.

# ප්‍රකෘති (මූලය) (පාඩම 11)

**ක්‍රියාකාරකම 01**

1. පහත සඳහන් ප්‍රාණවාචී නාමපදවල ප්‍රකෘතිය ලියන්න.

| | | | |
|---|---|---|---|
| I. | දරුවා................................ | vi. | ගුරුතුමා............................... |
| II. | පුතා................................ | vii. | නළුවා.................................. |
| III. | සිංහයා....................................... | viii. | බමුණෝ.............................. |
| IV. | ගිරවු.................................... | ix. | උගත්හු................................. |
| V. | මහල්ලෝ................................ | x. | ගොවියා................................ |

2. පහත සඳහන් අප්‍රාණවාචී පදවල නාම ප්‍රකෘතිය ලියන්න.
   - I. උදැල්ල...........................................
   - II. ගංගාවෝ..........................................
   - III. කන්ද.................................................
   - IV. බෝතලය..........................................
   - V. ගබඩාව.............................................

3. පහත සඳහන් නාමපද සකස් වූ ආකාරය ලියන්න.

| | | |
|---|---|---|
| I. | පහන | .................................+.................................... |
| II. | අත්ත | .................................+.................................... |
| III. | මහල්ලෝ | ................................+.................................... |
| IV. | කන්ද | ................................+.................................... |
| V. | සිංහයා | ................................+..................................... |

**ක්‍රියාකාරකම 02**

01.පහත සඳහන් ක්‍රියාපදවල ධාතු ප්‍රකෘතිය ලියන්න.

| | | | |
|---|---|---|---|
| I. | කරයි.................................... | vi. | පිසති........................................ |
| II. | දුවයි.................................... | vii. | ඇරඹුවෙමි................................ |
| III. | බබළයි................................ | viii. | සරසයි....................................... |
| IV. | ලියයි.................................... | ix. | නසවු........................................ |
| V. | ගයති.................................... | x. | කපන්නෙහි................................ |

**2016 O/L**

මිනිසාගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදිව දැක්වෙන්නේ කෙසේද?

1) මිනි + සාගේ
2) මිනිස් + ආගේ
3) මිනිසා + ගේ
4) මිනිසා + අගේ

**2017 O/L**

"අසමින්" යන ක්‍රියාපදයේ " අස " යනු,

1) ධාතු ප්‍රකෘතියයි
2) නිපාතයකි
3) ප්‍රත්‍යයකි
4) විශේෂණයකි

# විචාරයක් ලියමු. (පාඩම 12)

ප්‍රශ්නය - වීණා නාදයෙහි මිහිරියාව

i. මිනිසුන්ට බලපෑ ආකාරයත්
ii. සතුන්ට බලපෑ ආකාරයත්

විග්‍රහ කරන්න.

**විචාරයක් ලිවීමේ පියවර**

**01 පියවර**

ප්‍රශ්නයට අදාළ පාඩම සම්බන්ධයෙන් කෙටි හැඳින්වීමක් කිරීම

හැඳින්වීමේ අන්තර්ගතය

1. කතුවරයාගේ නම
2. උපුටාගත් කෘතිය
3. ලියැවුණු යුගය
4. පාඩමේ අරමුණ
5. ජීවිතයට ලබාදෙන ආදර්ශ

**02 පියවර**

හැඳින්වීම තුළින් 1 කොටසෙහි ප්‍රශ්නයට පිවිසීම

**03 පියවර**

පළමු උදාහරණය

- උදාහරණය ලිවීම
- උදාහරණය විස්තර කිරීම
- ප්‍රශ්නයට අදාළ පිළිතුර උදාහරණයෙහි තිබෙනවා යැයි තහවුරු කිරීම

**04 පියවර**

දෙවන උදාහරණය

............................

.............................

.............................

**05 පියවර**

11 කොටසෙහි ප්‍රශ්නයට පිවිසීම

..........................................................................................

**06 පියවර**

තෙවන උදාහරණය

- උදාහරණය ලිවීම
- උදාහරණය විස්තර කිරීම
- ප්‍රශ්නයට අදාළ පිළිතුර උදාහරණයෙහි තිබෙනවා යැයි විස්තර කිරීම

**07 පියවර**

සිව්වන උදාහරණය

.............................................

................................................

................................................

**08 පියවර**

සමස්ත තහවුරු කිරීම

# ක්‍රියා පද ප්‍රභේද (පාඩම 13)

**ක්‍රියාකාරකම්**

- පහත සඳහන් වාක්‍යවල අතීත කාල ශුද්ධ ආඛ්‍යාත පද යොදන්න.
    - i. මම පොත . ............................
    - ii. අපි පොත් . ............................
    - iii. තෝ පොත . ...........................
    - iv. තොපි පොත් . ..........................
    - v. සිසුවා පොත . ..........................
    - vi. සිසුහු පොත් . ..........................
- ආශිර්වාද ක්‍රියා පද යොදා වාක්‍ය පහක් ලියන්න.
- විධි ක්‍රියා පද යොදා වාක්‍ය පහක් ලියන්න.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද යොදා වාක්‍ය පහක් ලියන්න .
- මිශ්‍ර ක්‍රියා පද යොදා වාක්‍ය පහක් ලියන්න.
- පූර්ව ක්‍රියා පද යොදා වාක්‍ය පහක් ලියන්න.
- අසම්භාව්‍ය ක්‍රියා පද යොදා වාක්‍ය පහක් ලියන්න.
- තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
    - i. වැසි **වසිද්දී** ගඟ පිටාර ගලන්නට විය.
    - ii. “දරුව, මෙහි **එන්නැ”** යි අම්මා කතා කළා ය.
    - iii. නංගී උදෙන් ම නැගිට **කා බී සැරසී** පාසල් ගියා ය.
    - iv. අහිකුණ්ඨිකයා නයා **නටවමින්** ගමට ගියේ ය.
    - v. කැලයේ තිබෙන කොයි දේවත් **රස වේවා!**
    - vi. පුතුනි, **බලන්** යොමා නුවන්
    - vii. සවන් උඩු **කෙරෙමින්**
    - viii. අහිකුණ්ඨිකයා නයා **නටවයි.**
    - ix. වැව් **පිරුණොත්** කෙත් වතු සරු වේවි.
    - x. ශිෂ්‍යයා පුවත්පත **කියවයි.**

# කර්තෘ කාරක වාක්‍ය හා කර්ම කාරක වාක්‍ය (පාඩම 14)

- ❖ වාක්‍යයක් යනු සම්පූර්ණ අදහසක් ප්‍රකාශ වන පරිදි පිළිගත් රටාවකට පද කිහිපයක් ගැළපීමයි.
- ❖ වාක්‍ය ප්‍රධාන කොටස් 02 ට බෙදේ. → සකර්මක වාක්‍ය
  → අකර්මක වාක්‍ය
- ❖ සකර්මක වාක්‍යයක් තුළ ප්‍රධාන අංග 03 කි.

| මම | ගෙදර | යමි. |
|---|---|---|
| ↓ | ↓ | ↘ |
| කර්තෘ/උක්තය | කර්මය/අනුක්තය | ආඛ්‍යාතය/අවසාන ක්‍රියාව |

- ❖ සකර්මක වාක්‍ය ප්‍රධාන කොටස් 02 කි.
  1. කර්තෘකාරක වාක්‍ය
     වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කර්තෘ උක්ත වන්නේ නම් ඒ කර්තෘකාරක වාක්‍යයයි.
  2. කර්මකාරක වාක්‍ය
     වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කර්මය උක්ත වන්නේ නම් ඒ කර්ම කාරක වාක්‍යයයි.
     (පාඩම් අංක 09 – 10 ශ්‍රේණිය - වැඩිදුර තොරතුරු)
- ❖ මෙම වාක්‍ය සකස් කිරීමේ දී ඔබ හොඳින්ම උක්තය, කර්මය, ආඛ්‍යාතය හඳුනා ගත යුතුය.

1) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය බවට පත් කරන්න.
   - I. ගුරුතුමා සටහන් පොත පරීක්ෂා කළේ ය.
   - II. හෙදිය ඖෂධ මාත්‍රා රෝගියාට දුන්නා ය.
   - III. අපි පොත් කියවමු.
   - IV. ගොවියෝ කුඹුරු කොටති.
   - V. දන්ත වෛද්‍යවරු මුඛ රෝග පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කළහ.
   - VI. නළු නිළියෝ විචිත්‍රවත් රංගනයක යෙදෙමින් ප්‍රේක්ෂකයන් සතුටට පත් කළහ.

(2017 O/L)

2) කර්තෘකාරක වාක්‍ය බවට හරවන්න.
   - I. මා විසින් පොත මේසය උඩ තැබෙයි.
   - II. ඔවුන් විසින් අපි සුරක්ෂා කරනු ලැබීමු.
   - III. දරුවන් විසින් අම්මා සොයන ලද්දීය.
   - IV. මිනිසා විසින් ගස් කැපෙයි.
   - V. සොරුන් විසින් ආරක්ෂකයෝ පරාජය කරන ලදී.

**වාක්‍ය රීතී** (පාඩම 15)

(11) සදොස් තැන් නිදොස් කරන්න.

(1) ඕ තොමෝ බෙහෝ වෙහෙස මහන්සි වී වැඩෙහි යෙදුනේ ය.

(2) අමාත්‍යවරුන් පරිසර ගැටළුව සම්බන්ධයෙන් දැරූ මතය කවරේ ද?

(3) නර්තන ශිල්පීන් දක්ෂ වාදකයන්ද වූහ.

(4) රියදුරෝ මාර්ග නීති කඩ කළේ ඇයි ?

(5) ඔහු දක්ෂ ශිෂ්‍යයෙක් ලු.

පාඩමට හොඳින් සවන් දී පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

(1) (සිරකරුවෝ / සිරකරුවන්) මනුෂ්‍යයෝ ය.

(2) (ඔවුන් / ඔවුහු) දක්ෂ වෙසක්කරුවෝ ලු.

(3) (මම / මා) මාගේ අරමුණ කරා ළඟා වන්නේ කවදාද ?

(4) නදී (තොමෝ / තෙමේ) නිහඬවම ගලා ගියාය.

(5) එම පාසලේ (ශිෂ්‍යයෝ / ශිෂ්‍යයන්) දක්ෂ ක්‍රීඩකයෝ වෙති.

## වාක්‍ය රීති 2 (පාඩම 16)

01. පහත සඳහන් වාක්‍ය නිවැරදි කරන්න.

i. ළමයා ගමට යති.
ii. ගොවියෝවැඩ කරයි.
iii. ගංගාවෝ ගලා බසියි.
iv. නුඹ වැඩ කළෝය.
v. මම පාසල් ගියෙමු.
vi. ගස සුළඟට වැනෙති.
vii. අම්මාත්, තාත්තාත් නගරයට යයි.
viii. නංගී ද මල්ලී ද නුවරින් පිටත් වෙයි.
ix. අපි කාර්යාලයට ගියෙහු.
x. නුඹලා රැස්වීමට ගියෙහි.
xi. කොක් රැන අහස පුරා සැරිසරයි.
xii. ගුරු මණ්ඩලය විභාගය පැවැත්වූයේ ය.
xiii. තාරකා සමූහය බබලති.
xiv. ඇතමෙක් නැටුමෙහි නිරතවෙයි.
xv. පියාණෝ අවවාද දුන්නේ ය.

02.නිවැරදි පදය යටින් ඉරක් අඳින්න.

i. (අපි/මම) පාසල් ගියෙමු.
ii. (තාරකාවෝ/ තාරකාවන්) අහසේ බබලති.
iii. තාත්තා හෝ මම වැඩ ( කරමි/ කරමු)
iv. (මම/ මා) විභාගයෙන් සමත් වෙති යි අම්මා සිතුවාය.
v. (අපි/ අප) වැඩ කළ යුතුය.
vi. (පියාණෝ/ පියාණන්) දරුවන්ට තරවටු කළෝය.
vii. සමහරෙක් (කති/ කයි)
viii. (මා/ මම) සහ අම්මා ගමට ගියා ය.
ix. (ගුරුළුගෝමීන්/ ගුරුළුගෝමීහු) අමාවතුර රචනා කළහ.
x. නුඹලා වැඩ (කරහු/ කරහි)

## විරාම ලක්ෂණ (පාඩම 17)

1. තිත (.)
2. දෙතිත (:)
3. කොමාව(,)
4. තිත් කොමාව(;)
5. ප්‍රශ්නාර්ථ ලකුණ(?)
6. විශ්මයාර්ථ/ හර්ෂාදී ලකුණ(!)
7. උද්ධෘත පාඨ/ පෙරළි කොමා/ උඩු කොමා(“ ”)
8. දෙතිත හා ඉර (: -)
9. තනි උඩු කොමා (‘ ’)
10. කෙටි ඉර (-)
11. දිග ඉර (_)
12. වරහන් ( )
13. යුගල වරහන්/ සඟල වරහන් { }
14. ඇල ඉර/ හැඩ ඉර (/)
15. කාක පාදය (^)
16. තිත් තුන (...)
17. තිත් හතර (....)
18. තාරකා ලක්ෂණය (*)
19. කුණ්ඩලිය (^)
20. පෙයියාලම ( ^ප^)

**අභ්‍යාසය -ඉහත විරාම ලක්ෂණ යෙදෙන අවස්ථා හඳුනා, පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු තැන්වල විරාම ලක්ෂණ යොදන්න.**

1.පුතේ බත් කෑවද

2.දුටුගැමුණු රජු පණ්ඩුකාභය රජු වසභ රජු මහසෙන් රජු අපේ වාරි තාක්ෂණයේ මෙන්ම අභිමානයේ ද සලකුණුය

3.රජතුමා ඒ සඳහා මහත් කැපකිරීමක් කරන ලදී

4.දරුව මෙහි එන්න

5.අහෝ මේ කිනම් විපතක්ද

6.ගම්පෙරළිය මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විශිෂ්ට නවකතාවලින් එකකි

7.ගුරුවරු පොත් ලියූහ ඉගැන්වූහ කියවූහ

8.පී ඩබ් ආර් තෙන්නකෝන් මහතා වේදිකාවට පැමිණෙන්න

9.දූවේ මෙහෙ එන්න අම්මා කීවාය

10.රාම රාවණා යුද්ධය පිළිබඳ ඉතිහාසයේ සඳහන්ව තිබේ

## බසින් රස මවන සාහිත්‍යය (පාඩම 18)

භාෂාවේ වෙනස්කම් තුළින් සාහිත්‍ය නිර්මාණයක රසය වෙනස්වන අයුරු හඳුනා ගනිමු.

- කථන ව්‍යවහාරය
  ..........................................................................
  ..........................................................................
- ලේඛන ව්‍යවහාරය
  ..........................................................................
  ..........................................................................
- කවිබස්වහර හා ජනකවිවහර
  ..........................................................................
  ..........................................................................
- ව්‍යංගාර්ථය
  ..........................................................................
  ..........................................................................
- වාච්‍යාර්ථය
  ..........................................................................
  ..........................................................................
- ධ්වනිථාර්ථය
  ..........................................................................
  ..........................................................................
- භාවිත ගුණය
  ..........................................................................
  ..........................................................................
- වියත් වහර හා කට වහර මිශ්‍ර භාෂාව
  ..........................................................................
  ..........................................................................
- සංකල්ප රූප
  ..........................................................................
  ..........................................................................
- උපමා රූපක
  ..........................................................................
  ..........................................................................
- අතිශෝක්තිය
  ..........................................................................
  ..........................................................................
- ස්වභාවෝක්තිය
  ..........................................................................
  ..........................................................................
- ශබ්ද රසය
  ..........................................................................

## නිපාත පද හා උපසර්ග පද (පාඩම 19)

**ක්‍රියාකාරකම 01**

- පහත සඳහන් නිපාත පද සුදුසු පරිදි යොදා වාක්‍ය තනන්න.

01. අතර, අන්න, අනුව, අනේ, අපොයි
02. ඇතුළත්, ඇයි, ඇත, ඇතුළු, ඉක්බිති
03. ඉතා, ඉතින්, ඉදින්, ඉඳුරා, ඉඟි
04. උදෙසා, එපා, එම්බල, එහෙත්, එක්කෝ
05. ඔන්න, ඔස්සේ, කරා, කැටුව

**ක්‍රියාකාරකම 02**

- පහත සඳහන් පදවල උපසර්ග වෙන් කොට දක්වන්න.

1. පිහිකුළු, අතිරස, පිළිතුරු, පසක්, අපහාස, උපදෙස්, අබිමන්

   ........................................................................................................

2. උදුල, සුවිසල්, අදියර, විමල්, දුදන, නිදොස්, අනුබල, සබඳ

   ........................................................................................................

3. අවගුණ, පරසිඳු, පබල, පවර, පරපද, අවමාන, සරාගී, අනුරූ

   ........................................................................................................

4. නිකෙලෙස්, නිරොද, දුලද, විදෙස්, අයැදුම, අදිපති,සුදන, උපත

   ........................................................................................................

5. අබිසෙස්, පිරිනිවන, උපහාස, අපගමනය, පිළිවෙත්, අතිකාල

   ........................................................................................................

6. අබිනික්මන, අනුශූරතා, උවැසි, සුපිරිසිදු, පිළිසකර, අපගමන

   ........................................................................................................

# ප්‍රත්‍යයාර්ථ නාම (පාඩම 20)

- ප්‍රත්‍යයාර්ථ ප්‍රභේදදෙකකි.
  1. තද්ධිත නාම  කෘතියකට අර්ථවත්නාම ප්‍ර -ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදේ.
  2. කෘදන්ත නාම .යක් එක් වීමෙන් සෑදේත්‍යකෘතියකට අර්ථවත් ප්‍රධාතු ප්‍ර -

**ක්‍රියාකාරකම01**

පහත සඳහන් තද්ධිත නාමවල ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කර දක්වන්න.

නැකති, දැහැමි, මැදිරි, සෙල්මුවා, කර්මය, ආදර්ශවත්,
පෙම්වත්, ප්‍රභාමත්, විධිමත්, යෞවන, පියාටු, දොරටු, පහත්,
සෙනෙහස, දශම, කැනිති, දාරක,
ස්වාභාවික, මානසික, භෞතික, දේශීය, ගුරුත්ව, වෛද්‍ය,
කාව්‍ය, විරෝධතා, විශේෂතා, ස්ථිරතර, ප්‍රියතම, මයිලණු,
පියාණෝ

**ක්‍රියාකාරකම02**

පහත සඳහන් කෘදන්ත නාමවල ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කර දක්වන්න.

බලනු, කියන, පිවිසි, ගැයූ, රැකුණ, බැලුණු, බැලුම්, නැටීම්, නැටිලි, නැටුමන්, බලනු

# සන්ධි (1කොටස) (පාඩම 21)

- උච්චාරණයේ පහසුව උදෙසා සිදුවන ශබ්ද ගැළපීමේ ක්‍රමයක් ලෙස සන්ධි හැඳින්වේ.
- සන්ධි වීමේ ප්‍රධාන ක්‍රම කිහිපයකි.

I. ලෝපය - ශබ්දයක් හෝ ශබ්ද කිහිපයක් ඉවත් කිරීම

ගුරු + (උ) තුමා → ගුරුතුමා

(උ) → ලොප් වේ/ඉවත් වේ

II. ආදේශය - පවතින ශබ්දයක් වෙනුවට වෙනත් ශබ්දයක් පැමිණීම

දඬ + (ක) ම    දඬ (ය) ම

ක → ය

III. ආගම - පවතින ශබ්ද අතරට අලුත් ශබ්දයක් එක් කිරීම

වි + අවුල් → වියවුල්

(ය්)

- සන්ධි කිරීමේදී, පෙර පදයේ අග අකුරත්, පසු පදයේ මුල අකුරත් අතර සන්ධිය හට ගනී.

මු (නි) + (උ) තුමා

පෙර පදයේ අග අකුර + පසු පදයේ මුල අකුර

- විසන්ධියේ රටා 04කි.

| පෙර පදයේ අග අකුර | පසු පදයේ මුල අකුර |
|---|---|
| ව්‍යඤ්ජන | ස්වර |
| ස්වර | ව්‍යඤ්ජන |
| ව්‍යඤ්ජන | ව්‍යඤ්ජන |
| ස්වර | ස්වර |

අති (න්) + (ඇ) ත

ද (ඬු) + (ක) ම

දු (ක්) + (ප) ත්

ගු (ණ) + (අ) ගුණ

01. සන්ධි කරන්න

I. මුල් + අසුන
II. එක් + ඇස්
III. ඔවුන් + ඔවුන්
IV. සුරු + අත
V. හිඟුරු + අල
VI. සහන + ආධාර
VII. මුනි + ඉඳු

02. විසන්ධි කරන්න.

I. නිලුපුල්
II. අතැති
III. උපනුපන්
IV. මැදගිල්ල
V. විදුරසුන
VI. ස්වර්ණාභරණ
VII. බුදුකුරු

## සන්ධි (2 කොටස) (පාඩම 22)

01. පහත සඳහන් පද සන්ධි කරන්න.

I. වට + උර
II. පරම + ඊශ්වර
III. දඩ + කම්
IV. ගඟ + තෙර
V. අඹ + මල්
VI. වළඳ + දෙක
VII. සන් + හස
VIII. කම් + හල
IX. කොක් + ගල
X. වල් + ඌරා
XI. දෙ + අත
XII. මහ + ඉසුරු
XIII. පිරි + කම්
XIV. සස + මිත්
XV. ගඟ + තලා
XVI. කටු + අත්ත
XVII. ගෙ + උයන්
XVIII. කොක් + ගල
XIX. නාරන් + මල
XX. මල් + අත්ත

02. පහත සඳහන් පද විසන්ධි කරන්න.

I. කොස්සත්ත
II. රුක්කත්තන
III. ගංගොඩ
IV. කිරිමැටියාන
V. ගෙත්තම්
VI. යක්කල
VII. කම්මුල
VIII. ලිග්ගල
IX. මුදලිඳු
X. මුනිතුමා
XI.වීරෝදාර
XII.පලාපල
XIII.මන්දෝත්සාහී
XIV.මුලිනුපුටා
XV.පසඟ
XVI.සිහිනිඟ
XVII.ස්වර්ණාභරණ
XVIII.දොරගුළු
XIX.රසාස්වාදය
XX.දිනිසුරු

03. පහත සන්ධි පද අයත් සන්ධි වර්ගය ලියන්න.

I. උපනූපන්
II. හිඟුරල
III. සුරඟන
IV. පරමේශ්වර
V. සදාචාර
VI. මිහින්තලා
VII. තුනුවඟ
VIII. ඇත්තල
IX. ලිබ්බොක්ක
X. සල්ලුයන

## න, ණ. ල, ළ භේදය (පාඩම 23)

පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය නිර්මාණය කරන්න.

1. වල (වනාන්තරය)
   ......................................................................................................................
2. වළ (ආවාටය)
   ......................................................................................................................
3. අලු (ආලෝකය)
   ......................................................................................................................
4. අළු (හස්ම/ එනම් පැහැය)
   ......................................................................................................................
5. පතල (ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීමට හාරන ලද්ද)
   ......................................................................................................................
6. පතළ (පැතිරුණු)
   ......................................................................................................................
7. පැල (කුඩා ගෙය)
   ......................................................................................................................
8. පැළ (පැළෑටි)
   ......................................................................................................................
9. සුලු (ස්වභාවය)
   ......................................................................................................................
10. සුළු (ස්වල්ප)
    ......................................................................................................................
11. මුල (ආරම්භය)
    ......................................................................................................................
12. මුළ (සමූහය)
    ......................................................................................................................
13. කල (කල්හි)
    ......................................................................................................................
14. කළ (කළ ගෙඩි / කරන ලද)
    ......................................................................................................................
15. බල ( බලය/ බලන්න/ මාළු විශේෂයක්)
    ......................................................................................................................
16. බළ (සෙබළු)
    ......................................................................................................................
17. යල (වාරය)
    ......................................................................................................................
18. යළ (නැවත)
    ......................................................................................................................
19. මල (පුෂ්පය/අපිරිසිදු/මලකඩ/උගුළ)
    ......................................................................................................................
20. මළ (මැරුණු)
    ......................................................................................................................

## සාම්ප්‍රදායික යෙදුම් (පාඩම 24)

- **ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

01. ....................................... කන්න ඕන වුණා ම කබරගොයාත් වෙනවාලු.
02. .බලි ඇරියත් නොයයි ............................ උපන්ගෙයි
03. වක්කඩේ .හැංගුවා වගේ .................................
04. .ගහන්න ඕනලු .................................... බැඳගත්ත
05. .ගහන්නා වගේ .............................. වැල යන අතට
06. .ගෙඩිය වගේ ........................... ගිරයට අහුවුණ
07. ............................... හින්දා බොන්නත් බෑ කිරි හින්දා අහක . දාන්නත් බෑ.
08. .දීලා මිරිස් ගත්තා වගේ .............................
09. .ගියා වගේ .......................... කළුවා
10. .වගේ .......................... එළිපත්ත උඩ ඉන්න

- **පහත සඳහන් වාක්‍යවලට රුචී ඉඟි වැකි යොදා හිස් තැන් පු /රවන්න.**

01. .බව තාත්තා කීවේ ය ........................................ රිය අනතුරකින්
02. .නැති විය ............................. සුනාමියෙන් බොහෝ දෙනාගේ මුළු
03. .....................................වැඩ කරන්න එපා යයි අම්මා සේවිකාවට කීවා ය.
04. .දිව ගියහ ............................. ඩා පිටියටළමයි ක්‍රී
05. .මෙන් වැව් බැම්ම අලුත්වැඩියා කළහ ................................... ගොවියෝ
06. .අපරාධකරුවන් සෙවූහ ............................ පොලිස් නිලධාරීහු කැලය
07. ................................උදා වී ඇති බැවින් කටයුතු සාර්ථක නො වන බව මාමා කීවේ ය.
08. .දිවූහ .......................... බෝම්බය පිපිරුණු විට අවට ජනයා
09. තැබීම සුදුසු ............................ නිලධාරීන් කැඳවා ඔවුන් වර්ණනා කොට .නැත
10. ...............................වගේ ශාස්ත්‍රය කියැවුණා යයි අම්මා කීවා ය.

- **පහත සඳහන් 'අ' කොටසෙහි යෙදුමට ගැළපෙන අදහස දෙන පිළිතුර 'ආ' කොටසින් තෝරන්න.**

**'අ' කොටස**

කතාවට වඩා ක්‍රියාව වැදගත් ය.
හොඳින් දැන උගත් තැනැත්තා උඩඟු නොවේ.
අපරාධ කරන්නෝ එයින් ම වැනසෙති.
තමාට පිහිට තමාම ය.
කෙතරම් යහපතක් කළ ද දුදන ගති දුරු නොවේ.
යමක් කරන්නට පෙර සිතා බලන්න.
ස්ථාවර යම් කාර්යයක නොයෙදෙන්නා පිරිහෙයි.
හේතුවක් නැති ව යමක් සිදු නොවේ.
ඇති අවුල තවත් වැඩි නො කරගන්න.
මතු දියුණුව පිණිස ශිල්ප ඉගෙන ගත යුතු ය.

**'ආ' කොටස**

උගත මනා ශිල්පයමැ යි මතු රැකෙනා .
අවවාදයට වඩා ආදර්ශය උතුම්ය.
පනින්න පෙර සිතා බලනු.
අත්තෙන් අත්තට පනින කුරුල්ලා තෙමී නසී.
ඇවිළෙන ගින්නට පිදුරු නොදමනු.
පිරුණු කළේ දිය නො සැලේ.
තමා හිසට තම අතම ය සෙවණැල්ල.
අවි ගත්තෝ අවියෙන් ම නසිති.
කිරෙන් සේදුවත් අඟුරු සුදු නොවේ.
ගින්නක් නැති ව දුමක් නො නඟී.

## ප්‍රාදේශීය ව්‍යවහාර (පාඩම 25)

**ඔබගේ මතකයට**

| | | | |
|---|---|---|---|
| වෛතාලය | හිම්දිරිය - | කුඩහළුවා | -ගැනු ළමයා |
| ඉරගල වැටීම | -ඉරබැසීම | කුමතේරුව | -අලාභහානි |
| කිතයියා | හඳ - | සංහිඳ | දෙවියන් පුදනතැන - |
| නිල්ල | පොදවැස්ස - | අකම්පාලවීම | -කනගාටු වීම |
| ඇටබක්කා | ඇටි කුකුළා - | සුම්බරේ | -ජටාව |
| ගොම්මන | වෙලාව අඳුරු - | මැරීම -තොලොංචි කිරීම | |
| කොට්ට තලනවා | -ඇනුම් අරිනවා | තෙද පානවා | -බලය පෙන්වනවා |
| රොද | කැලෑව - | වතු කැන් -කෙසෙල් කැන් | |
| හොටි අම්මා | -මැහැල්ල | සනුහරේ -පරම්පරාව | |
| බොටකඳා | අලියා - | අරියාදුව -කලබලේ | |
| පාන්කළුව | අරුණාලෝකය - | හෙරලි | කොස් - |
| හූරා | මස්සිනා - | හින්නික්කිතර | -සුළු |
| ගොබිලා | තරුණයා - | කළටි | ළා පොල් - |
| මූකරයාගස්ගෝනා/ | -වඳුරා | ඇඳුත්ත | සම්බන්ධ කිරීම - |
| සෝමාරියා | කම්මැළියා - | රෝන්දෙ යාම | -ඇවිදින්න යාම |
| කුදහනවා | නිදියනවා - | ඔයනවා | ලෙලි ගහනවා - |
| වාන බැඳීම | අමුණ බැඳීම - | කැකුලා | පිරිමි ළමයා - |
| රාහි කිරීම | වී ගොඩ කිරීම - | ගැටමන්දා - | කිඹුලා |
| පෙරන් ගෑම | -සීරීම | ගයිගැට | -පුවක් |
| පන්දලම | බුලත් මැස්ස - | ඔටා දමනවා | -නටනවා |
| මාරියාව | රළ ගැසීම - | හොටබරියා | -ඌරා |
| අම්බරුවා | මීහරකා - | මලාලිය | දූන්න - |
| දඬුබස්නාමානය | -ඊය වැටෙන දුර | වජ්පි | කුරුල්ලා - |
| පොහොනි කිරීම | -සංග්‍රහ කිරීම | වන්නි කුඩු | -කුරහන් පිටි |
| කෝලිත්තම් | -විහිළු | ඩැහැ ගන්නවා | -අල්ලා ගත්තා |
| නෝක්කාඩු | දො -ස් | අඩපාලා -කැගසා | |
| අද්දුවන්කම | -නොසැලකීම | ඉබි කබොල්ල | -ඉබි කට්ට |
| තාන්තුව | හැඩ වැඩ - | කොට්ට වෙලා | -අධික ලෙස වේළිලා |
| නඩය | කණ්ඩායම - | තනන්නේ -සූදානම් වන්නේ | |
| ගඟුල | වැස්ස - | එළවිලි | එළිය වෙලා - |
| හන්දුරුවා | රදලයා - | රඹතුරු | කෙසෙල් ගස් - |
| ජේවීම | සූදානම් ව -ීම | පණීඳා | නාගයා - |
| මඩම | ම ශාලාවිශ්‍රා - | කඩවත | මුරපොළ - |
| මද්දහන | ඉරමුදුන් වේලාව - | කපොලු | බාධකය - |
| සක්කරවට්ටම | -අහර දහර ගැහැනිය | කුපිත වෙලා | -උරණ වෙලා |
| මුලිච්චි | හමුවීම - | අතවැස්සා | -සහායකයා |
| විජ්ජුම්බර | විලාසිතා - | උප්පිඩ | කුඩා ගොයම් මිට - |
| අහේනිය | - සාගතය | අඩහැරය -අම්බරුවන් දිරිමත් කරන හඬ | |
| සෝලිය | කරදරය - | | |
| මන්දාරම | වැහිවලාකුළ - | තහංචි | තහනම - |
| බිම්භෝග | වගා ධාන්‍ය - | ඉපනැල්ල -ගොයම් කැපූ පසු ගොයම් ගසේ අල්ලපනල්ලේ - | |
| අතරතුර | | ඉතිරි වන කොටස | |
| අනෝරා වැස්ස | -නොකඩවා වැස්ස | | |
| සංගෙට නෑ | නැහැදිච්චකම - | සේදැරි කරනවා | -ඉක්මන් කරනවා |
| කොක්කනිය | -බුලත්මල්ල | ලියන්නාව -දැකැත්ත | |
| රූටලා යනවා | -ලිස්සා යනවා | යතුර | කුල්ල - |
| ගිනිපුක්කාරයා | -කේන්තිකාරයා | කමත | ගොයම් මඩවන තැන - |
| වටමළුව | ගොයම් ගොඩ - | කටුපන | වී දමන මල්ල - |
| දැති ගොයියා | -ගොයම් හැලීම සඳහා උපයෝගී කරගන්නා කරුවක් සහිත රිට | | |
| කුයිල | ගඳ - | | |
| කන්දරාව | විශාල පිරිස - | | |